සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# කෘෂි විද්‍යාව - I

12 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

01 ශාක මුල් වර්ධනයට හා ව්‍යාප්තියට වැඩිම බලපෑමක් ඇති කරන පාංශු සාධකය වනුයේ,
(1) දෘශ්‍ය ඝනත්වයයි. (2) ව්‍යුහයයි. (3) තෙතමනයයි.
(4) වර්ණයයි. (5) උෂ්ණත්වයයි. (......)

02 මැටි යනු,
(1) යාන්ත්‍රික ජීරණයේ ඵලයකි. (2) මැග්මා ක්ෂණික සිසිල් වීමේ ඵලයකි.
(3) මාතෘ ද්‍රව්‍ය ඔක්සිහරණය වීමේ ඵලයකි. (4) පාෂාණ ඔක්සිහරණය වීමේ ඵලයකි.
(5) රසායනික ජීරණයේ ඵලයකි. (......)

03 පාංශු ඛාදන සීඝ්‍රතාවට අවම බලපෑමක් ඇති කරුණ වනුයේ,
(1) වර්ෂාපතනයේ තීව්‍රතාව වේ. (2) ස්වභාවික වෘක්ෂලතා ප්‍රමාණය වේ.
(3) සුළඟේ වේගය වේ. (4) සූර්ය විකිරණයේ තීව්‍රතාව වේ.
(5) මතුපිට ගලා යන ජල පහරෙහි වේගය වේ. (......)

04 බිම් සැකසීම කරනුයේ,
(1) පාංශු වාතනය අඩු කිරීමටය. (2) වල් පැළ විනාශ කිරීමටය.
(3) ජලවහනය අඩු කිරීමටය. (4) පාංශු ඛාදනය අඩු කිරීමටය.
(5) පාංශු සුසංහනය වැඩි කිරීමටය. (......)

05 බෝග මාරුවකදී ගොවියෝ බොහෝ විට ධාන්‍ය බෝග සමඟ රනිල බෝග මාරුවෙන් මාරුවට වවති. එයට හේතුව රනිල බෝග,
(1) ඉහළ ප්‍රභාසංස්ලේෂණ වේගයකින් යුක්ත වීමය.
(2) මනුෂ්‍ය පෝෂණයට වඩාත් හිතර ඇමයිනෝ අම්ල සංයුතියෙන් යුත් ප්‍රෝටීන සහිත වීමය.
(3) හොඳින් වැඩී පසට විශාල වශයෙන් කාබනික ද්‍රව්‍ය එක් කිරීමය.
(4) පසේ නයිට්‍රජන් මට්ටම වැඩි කිරීමය.
(5) P හා K පොහොර අඩුවෙන් භාවිතා කිරීමය. (......)

06 ජල චක්‍රයට අවම බලපෑමක් ඇති කෙරෙන්නේ,
(1) ග්ලැසියර වලිනි. (2) මතුපිට ඇති මිරිදියෙනි.
(3) වායුගෝලීය ජල වාෂ්ප වලිනි. (4) මුහුදු ජලයෙනි.
(5) භූගත ජලයෙනි. (......)

07 කාබනික පොහොර භාවිතයේ ප්‍රතිලාභයක් වනුයේ,
(1) පසට අවශ්‍ය පමණ පොස්පරස් ලබා දීමය.
(2) පසේ ජලය රඳාගැනීමේ ධාරිතාව වැඩි දියුණු වීමය.
(3) පසෙහි $P^H$ අගය 7 ඉක්මවා වැඩි කිරීමය.
(4) පසට අවශ්‍ය නයිට්‍රජන් ලබා දීමය.
(5) ශාක පෝෂක ඉක්මනින් පාංශු ජලයට නිදහස් කිරීමය. (......)

08 ගෙවතු වගා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ,

(1) ගෙවත්ත තුළ ජෛව විවිධත්වය පවත්වා ගැනීමය.

(2) පවුලට පෝෂණය ලබා දීමය.

(3) ගෘහණියට අමතර ආදායමක් ලබා ගැනීමය.

(4) පවුලට පළිබෝධනාශක රහිත ආහාර ලබා ගැනීමය.

(5) භූමිය කාර්යක්ෂමව භාවිතා කිරීමය. (......)

09 ලණු ගෘහ ප්‍රධාන වශයෙන් භාවිතා කෙරෙන්නේ,

(1) කැපූ මල් කර්මාන්තයේ දී මල් පිපීම ආරම්භ කිරීමටය.

(2) පත්‍රමය ශාක පුහුණු කිරීමටය.

(3) රෝග සහ පළිබෝධවලින් ආරක්ෂා කර ගැනීමටය.

(4) දඬු කැබලිවලින් මුල් ඇද්දවීම පිණිසය.

(5) විශාල බීජ ප්‍රරෝහණය කිරීමටය. (......)

10 බිම් සැකසීමේ තැටි නගුල භාවිතයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ,

(1) කුඩා පස් අංශු ලබා ගැනීම හා වල් පැළ පාලනයයි.

(2) රෝග හා පළිබෝධ පාලනය හා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමයි.

(3) පස පෙරලීම, වාතනය දියුණු කිරීම හා වල් පැළ පාලනයයි.

(4) කුඩා පස් අංශු ලබා ගැනීම, තද ස්ථරය සෑදීම හා වාතනය දියුණු කිරීමයි.

(5) ජල වහනය දියුණු කිරීම හා සියුම් අංශු වලින් යුත් පාත්තියක් ලබා ගැනීමයි. (......)

11 ශක්තිය අඩංගු පෝෂක කාණ්ඩය වනුයේ,

(1) ග්ලූකෝස්, විටමින් B සහ විටමින් E ය.

(2) කාබෝහයිඩ්රේට, ලිපිඩ සහ විටමින් ය.

(3) සෙලියුලෝස්, මෙතයොනින් සහ ස්ටියරික් අම්ලය.

(4) අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල, අත්‍යවශ්‍ය මේද අම්ල සහ අත්‍යවශ්‍ය ඛණිජ වේ.


(5) පිෂ්ඨය, කැල්සියම් සහ විටමින් C ය. (......)

12 වැලි 55%, ලෝම 20%, මැටි 25% ක් වූ පාංශු නියැදියක වයන පංතිය වනුයේ,

(1) වැලිමය මැටි ලෝම (2) ලෝම වැලි (3) වැලිමය මැටි

(4) වැලිමය ලෝම (5) රොන්මඩ සහිත මැටිලෝම (......)

13 රූපයේ දැක්වෙන මෙම පාංශු ව්‍යුහය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,



(1) කුට්ටි ලෙසය.

(2) ප්‍රිස්මාකාර ලෙසය.

(3) තැටි ලෙසය.

(4) තනි කණිකා ලෙසය.

(5) කණි කාමය ලෙසය. (......)

14 වී වගාව සඳහා බිම් සැකසීමේ දී පසේ ව්‍යුහය,

(1) අඩු වේ. (2) විනාශ වේ. (3) වෙනස් නොවේ.

(4) සුසංහනය වේ. (5) වැඩි දියුණු වේ. (......)

15 ආහාර අධිශීත ගබඩා කිරීමේදී,

(1) ක්‍ෂුද්‍ර ජීවීන් හා ඔවුන්ගේ බීජාණු යන දෙකම විනාශ වේ.

(2) ක්‍ෂුද්‍ර ජීවීන් හා ඔවුන්ගේ බීජාණු අක්‍රිය වේ.

(3) ක්‍ෂුද්‍ර ජීවීන් නිකුත් කරන විෂ වර්ග විනාශ වේ.

(4) ක්‍ෂුද්‍ර ජීවී එන්සයිම සඳහටම අක්‍රිය වේ.

(5) ක්‍ෂුද්‍ර ජීවීන් විනාශ වේ. (......)

16 ශිෂ්‍යයකුට තමා සතු බීජ නියැදියක ජීව්‍යතාව පරීක්‍ෂා කිරීමට අවශ්‍ය විය. එහෙත් බීජ නියැදියේ සුප්තතාව පිළිබඳ කිසිම තොරතුරක් ඔහු සතුව නොතිබිණි. මෙම බීජ නියැදියේ ජීව්‍යතාව පරීක්‍ෂා කිරීමට වඩාත්ම සුදුසු ක්‍රමය වනුයේ,

(1) ටෙට්‍රා සෝඩියම් ක්ලෝරයිඩ් ක්‍රමයයි. (2) උණුසුම් ජල ප්‍රතිකාර ක්‍රමයයි.

(3) පෙට්‍රි දීසි ක්‍රමයයි. (4) තවත් පෙට්ටි ක්‍රමයයි.

(5) රැග්ඩෝල් ක්‍රමයයි. (......)

17 පළතුරු හා එළවළු ශ්‍රේණිගත කිරීමෙන් ඒවායේ,

(1) පසු අස්වනු හානි වැඩිවේ. (2) වෙළඳපොළ ඉල්ලුම අඩු කළ හැකි වේ.

(3) විකුණුම් මිල වැඩිකර ගත හැකිවේ. (4) පසු අස්වනු හානි වැඩිවේ.

(5) මිල පාලනය කිරීමට හැකිවේ. (......)

18 පසක අඩංගු ශාකයට ලබාගත හැකි ජලය ප්‍රමාණය,

(1) අතිරික්ත ජලයේ කොටසකි. (2) අපධාව ජලයේ කොටසකි.

(3) ජලාකර්ෂණ ජලයේ කොටසකි. (4) ගුරුත්වාකර්ෂණ ජලයේ කොටසකි.

(5) කේශාකර්ෂණ ජලයේ කොටසකි. (......)

19 දුම් ගැසීමෙන් ගබඩා කාලය වැඩිකළ හැක්කේ,

(1) ඉඟුරුවලය (2) ගොරකාවලය (3) කුරුඳු වලය

(4) එැණු වලය (5) ගම්මිරිස් වලය (......)

20 නවීනතම වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප,

(1) 7 ක් තිබේ. (2) 9 ක් තිබේ. (3) 3 ක් තිබේ. (4) 24 ක් තිබේ. (5) 46 ක් තිබේ. (......)

21 ශාකවල පැවැත්මට බීජ වැදගත් වනුයේ ඒවායේ ඇති,

(1) ව්‍යාප්ත වීමේ හා අහිතකර තත්ත්ව මඟ හරවා ගැනීමේ හැකියාව නිසාය.

(2) ව්‍යාප්ත වීමේ හැකියාව හා තද බීජාවරණයක් තිබීම නිසාය.

(3) අහිතකර තත්ත්ව මඟ හරවා ගැනීමේ හැකියාව හා දීර්ඝ සුප්ත කාලය නිසාය.

(4) හැඩය තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලය නිසාය.

(5) තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලය නිසාය. (......)

22 පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙන් අඩු වන්නේ එම පසෙහි,

(1) ජලය රඳා සිටීමේ ධාරිතාවය.

(2) පාංශු ක්‍ෂුද්‍ර ජීවී ගහණයය.

(3) පොහොර භාවිත කාර්යක්ෂමතාවයය.

(4) දෘශ්‍ය ඝනත්වයය.

(5) වගා කර ඇති බෝග ශාකවල පෝෂක අවශෝෂණය කර ගැනීමේ හැකියාවය. (......)

23 කරවිල, පතෝල, පිපිඤ්ඤා වැනි බෝග ගබඩා කර තැබීමේ දී දර අළු මිශ්‍ර කරයි. මෙය කරනු ලබන්නේ,

(1) බීජ සුප්තතාවය බිඳීමටය.

(2) පළිබෝධ හානි පාලනය කිරීමටය.

(3) බීජ සුප්තතාවය පවත්වා ගැනීමටය.

(4) හිරු එළියෙන් ආරක්‍ෂා කර ගැනීමටය.

(5) බීජයේ තෙතමන ප්‍රමාණය පාලනය කිරීමටය. (......)

24 පසේ $P^H$ අගය 4 දක්වා පහත ගිය අවස්ථාවලදී පවා ශාකයට ලබාගත හැකි අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය වනුයේ,

(1) Fe (2) Mg (3) S (4) Ca (5) K (......)

25 වියළි කලාපයේ බෑවුම් සහිත බිමක් හිමි ගොවියෙකුට එහි විශාල බීජ සහිත බෝගයක් සිටුවීමට වඩාත් උචිත බිම් සැකසීම වනුයේ,

(1) කැට පොඩි කිරීමය. (2) තැටි නගුලෙන් සී සෑමය. (3) අවම බිම් සැකසීමය.

(4) මඩ කිරීමය. (5) පෝරු ගෑමය. (......)

26 බීජ සුප්තතාවය ඉවත් කළ හැක්කේ,

(1) බීජ ආමුකුලනය කිරීමෙනි. (2) බීජ ජීවානුහරණය මඟිනි.

(3) බීජ ආවරණය කිරීමෙනි. (4) බීජ සීරීමෙනි.

(5) ඉහත කිසිවකින් නොවේ. (......)

27 ආග්නේය පාෂාණ යනු,

(1) බර මැටි තැන්පතු අධික පීඩනයකට භාජනය වී තද වීමෙන් සෑදුන දෙයකි.

(2) අධික පීඩනය හා උෂ්ණත්වයට භාජනය වූ අවසාදිත පාෂාණ වලින් සෑදුන දෙයකි.

(3) ප්‍රාථමික පාෂාණ ජීර්ණය, ප්‍රවාහණය හා නැවත තැන්පත් වීමේ ප්‍රතිඵලයකි.

(4) හුළු ගල් අධික උෂ්ණත්වයකට භාජනය වීමෙන් සෑදුන දෙයකි.

(5) පෘථිවි පෘෂ්ඨය සිසිල් වීමෙන් සෑදුන දෙයකි. (......)

28 ප්‍රාථමික පස් අංශු ද්විතීයික අංශු බවට සකස් වීම,

(1) පාංශු වයනය ලෙස හැඳින්වේ. (2) පාංශු ව්‍යුහය ලෙස හැඳින්වේ.

(3) දෘෂ්‍ය ඝනත්වය ලෙස හැඳින්වේ. (4) අංශු ඝනත්වය ලෙස හැඳින්වේ.

(5) පාංශු රූපාකාරය ලෙස හැඳින්වේ. (......)

29 පසක ජලය දරාගැනීමේ ධාරිතාව ප්‍රධාන වශයෙන් නිර්ණය වනුයේ එම පසෙහි,

(1) $P^H$ අගය මඟිනි. (2) ඇති මූල කේශ ප්‍රමාණය මඟිනි.

(3) ඇති ක්‍ෂුද්‍ර ශාක ප්‍රමාණය මඟිනි. (4) අඩංගු අංශුවල ප්‍රමාණය මඟිනි.

(5) අයන හුවමාරු ධාරිතාව මඟිනි. (......)

30 සංරක්‍ෂණ ගොවිතැනේ ප්‍රධාන පරමාර්ථ වනුයේ කෘෂි නිෂ්පාදනයක් ලබා ගන්නා අතරම,

(1) පස, ජලය හා ජෛව විවිධත්වය සංරක්‍ෂණය කිරීමය.

(2) නැවත උත්පාදනය කළ නොහැකි ශක්ති ප්‍රභව, බෝග විවිධත්වය හා ස්වභාවික සතුරන් සංරක්‍ෂණය කිරීමය.

(3) පසෙහි අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය, තෙතමන ප්‍රමාණය හා ක්‍ෂුද්‍ර ජීවීන් සංරක්‍ෂණය කිරීමය.

(4) ජාන ප්ලාස්ම, පාංශු පැතිකඩ හා භූමි දර්ශනය සංරක්‍ෂණය කිරීමය.

(5) සම්ප්‍රදායික වගා පද්ධති, පාංශු ජීවීන් හා ජලය සංරක්‍ෂණය කිරීමය. (......)

The National e-Learning Portal for the General Education

31 ධාන්‍ය ගබඩා කිරීමට වඩාත් උචිත තත්ත්වය වනුයේ,

(1) මධ්‍යම උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය.
(2) අඩු උෂ්ණත්වය හා මධ්‍යම ආර්ද්‍රතාවය.
(3) අඩු උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාවය.
(4) මධ්‍යම උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාවය.
(5) අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය. (......)

32 වයිරස් වලින් තොර රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වඩාත් සුදුසු රෝපණ ක්‍රමය වනුයේ,

(1) රෝග වලින් තොර ශාකයක් සමඟ රිකිලි බද්ධ කිරීමය.
(2) අග්‍රස්ථ අංකුරය ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීමය.
(3) අතු කැබලි මගින් ප්‍රචාරණය කිරීමය.
(4) රෝග වලින් තොර ශාකයක් සමඟ අංකුර බද්ධ කිරීමය.
(5) බීජ මගින් ප්‍රචාරණය කිරීමය. (......)

33 ප්‍රචාරන ව්‍යුහ තුළ ''හරිතාගාර ආවරණය'' යොදනු ලබන්නේ,

(1) ඉහළ ආර්ද්‍රතාවක් පවත්වා ගැනීමටය.
(2) ඉහළ ආලෝක තීව්‍රතාවක් පවත්වා ගැනීමටය.
(3) ඉහළ උෂ්ණත්වයක් පවත්වා ගැනීමටය.
(4) ප්‍රශස්ත ආලේක ගුණාත්වයක් පවත්වා ගැනීමටය.
(5) පත්‍රවල හරිත පැහැය රැකගැනීමටය. (......)

34 ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලන වැඩ සටහන්වල දී විලෝපිකයන් බහුලව යොදා ගැනේ. එවැනි විලෝපිකයකුට උදාහරණයක් වනුයේ,

(1) ගොම කුරුමිණි
(2) ලේඩි බර්ඩ් කුරුමිණියා
(3) පළතුරු මැස්සා
(4) පැළ කීඩෑවා
(5) පතංගයා (......)

35 තුත්තනාගම් යනු,

(1) අත්‍යාවශ්‍ය නොවන මූලද්‍රව්‍යයකි.
(2) ජිප්සම්වල අඩංගු ද්‍රව්‍යයකි.
(3) ශාකවලට විෂ ද්‍රව්‍යයකි.
(4) අත්‍යවශ්‍ය මහා මූලද්‍රව්‍යයකි.
(5) අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයකි. (......)

36 බීජ ගබඩා කිරීමට වඩාත් සුදුසු තත්ත්ව වනුයේ,

(1) අඩු වාතනය හා ආර්ද්‍රතාවයයි.
(2) අඩු වාතනය හා උෂ්ණත්වයයි.
(3) අඩු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයයි.
(4) අඩු ආලෝක තීව්‍රතාවය හා ආර්ද්‍රතාවයයි.
(5) අඩු ආලෝක තීව්‍රතාවය හා උෂ්ණත්වයයි. (......)

37 ආහාර වලට ප්‍රතිඔක්සිකාරක ද්‍රව්‍ය එක් කරනුයේ,

(1) පළිබෝධ හානි සහ දුර්වර්ණ වීම වැළැක්වීමටය.
(2) විටමින සහ ජලය ඉවත් වීම වැළැක්වීමටය.
(3) විටමින සහ හෝර්මෝන ඉවත් වීම වැළැක්වීමටය.
(4) මුඩුවීම සහ දුර්වර්ණ වීම වැළැක්වීමටය.
(5) මුඩුවීම සහ හෝර්මෝන ක්‍රියාකාරීත්වය වැළැක්වීමටය. (......)

38 ත්‍රිගුණ ශාක,

(1) බීජ රහිත විශාල ඵල නිපදවයි.
(2) බීජ ස්වල්පයක් ඇති විශාල ඵල නිපදවයි.
(3) බීජ රහිත කුඩා ඵල නිපදවයි.
(4) බීජ ස්වල්පයක් ඇති කුඩා ඵල නිපදවයි.
(5) ඉහත කිසිවක් අදාළ නොවේ. (......)

39 අතු බැඳීමේදී,

(1) පොත්ත ඉවත් නොකළ යුතු නමුත් අත්තෙහි ඇති පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතුය.

(2) මුල් ඇදීම වන ස්ථානයට පහළින් පොත්ත ඉවත් කළ යුතුය.

(3) මුල් ඇදීම වන ස්ථානයට ඉහළින් පොත්ත ඉවත් කළ යුතුය.

(4) අත්තෙහි ඇති පත්‍ර සියල්ල ඉවත් කළ යුතුය.

(5) පොත්ත හා අත්තෙහි පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතුය. (......)

40 පස් පැතිකඩක $O(A_0)$ මහල,

(1) මාතෘ පාෂාණ ද්‍රව්‍ය වලින් සෑදී ඇත.

(2) පිහිටා ඇත්තේ R මහල ළඟම ඊට ඉහළින් ය.

(3) පිහිටා ඇත්තේ A මහල ළඟම ඊට පහළින් ය.

(4) සමහර අවස්ථාවලදී E මහල ලෙස හැඳින්වේ.

(5) සමහර පස්වල ඉහළින්ම පිහිටා ඇති ස්ථරය වේ. (......)

41 උදෑසන පැහැපත්ව අහස තිබී සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි වසින්නට පටන් ගන්නා අතර පසුව එය ක්‍රමයෙන් වෙරළබඩ ප්‍රදේශවලටද පැතිරේ. මෙම වැසි හඳුන්වනුයේ,

(1) ඊසාන දිග මෝසම් වැසි ලෙසය. (2) අන්තර් මෝසම් වැසි ලෙසය.

(3) නිරිත දිග මෝසම් වැසි ලෙසය. (4) සුළි සුළං වැසි ලෙසය.

(5) නිවර්තන අකුණු කුණාටු ලෙසය. (......)

42 ශූන්‍ය බිම් සැකසීමේ දී,

(1) අනෙකුත් බිම් සැකසීමේ ක්‍රමවලට සාපේක්ෂව අඩු වල් නාශක ප්‍රමාණයක් භාවිතා වේ.

(2) අනෙකුත් බිම් සැකසීමේ ක්‍රමවලට සාපේක්ෂව වැඩි වල් නාශක ප්‍රමාණයක් භාවිතා වේ.

(3) පූර්ව නිර්ගමන වල්නාශක පමණක් භාවිතා කෙරෙයි.

(4) පශ්චාත් නිර්ගමන වල් නාශක පමණක් භාවිතා කෙරෙයි.

(5) පූර්ව නිර්ගමන වල්නාශක පමණක් භාවිතා නොකරයි. (......)

43 වර්ධනය නිශේධනය කරන ශාක හෝර්මෝනයක් වනුයේ,

(1) සයිටොක්සිනීන් ය. (2) ගිබරලීන් ය. (3) ඔක්සීන් ය.

(4) ඇබ්සිසික් අම්ලය. (5) ඉහත කිසිවක් නොවේ. (......)

44 ශාකවල පැවැත්ම සඳහා බීජ වැදගත් වනුයේ,

(1) ඒවායේ ඇති අහිතකර තත්ත්ව මඟ හැරීමේ හැකියාව නිසාය.

(2) එමඟින් ශාක ගුණනය විය හැකි නිසාය.

(3) ඒවායේ ඇති ව්‍යාප්ති වීමේ හැකියාව නිසාය.

(4) බීජාවරණය නිසාය.

(5) ඉහත 1, 2 හා 3 නිසාය. (......)

45 වී වල පසු අස්වනු සැකසීමේ දී වැඩිම හානියක් වාර්තා වන්නේ,

(1) කෙටීමේදී ය. (2) ගබඩා කිරීමේදී ය.

(3) අස්වනු නෙළීමේදී ය. (4) වී තැම්බීමේදී ය.

(5) පෑගීමේදී ය. (......)

46 මනුෂ්‍යයන්ගේ ආහාර වේලට පළතුරු වලින් ප්‍රධාන වශයෙන් ලැබෙනුයේ,

(1) විටමින්, ප්‍රෝටීන් සහ මේදය යි.
(2) ජලය, කාබෝහයිඩ්රේට සහ මේදය යි.
(3) ජලය, ප්‍රෝටීන් සහ ඛණිජ ය.
(4) විටමින් ජලය සහ මේදය යි.
(5) විටමින්, කාබෝහයිඩ්රේට සහ ඛණිජ ය. (......)

47 උස ශාකයක ජල අවශෝෂණය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ,

(1) තිපානය මඟිනි
(2) උත්ස්වේදන චූෂණය මඟිනි
(3) මූල පීඩනය මඟිනි
(4) කේෂික ක්‍රියාව මඟිනි
(5) වායුගෝලීය පීඩනය මඟිනි (......)

48 බෝග මාරුවකදී ගොවියෝ බොහෝ විට ධාන්‍ය බෝග සමඟ රනිල බෝග වගා කරති. ඊට හේතුව රනිල බෝග,

(1) P හා K පොහොර අඩුවෙන් භාවිතා කිරීමය.
(2) ඇමයිනෝ අම්ල සංයුතියෙන් යුත් ප්‍රෝටීන සහිත වීමය.
(3) හොඳින් වැඩී පසට විශාල වශයෙන් කාබනික ද්‍රව්‍ය එක් කිරීමය.
(4) පසේ නයිට්‍රජන් මට්ටම වැඩි කිරීමය.
(5) ඉහළ ප්‍රභාසංස්ලේෂණ වේගයකින් යුක්ත වීමය. (......)

49 සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීමට භාවිතා කරන උපකරණය වනුයේ,

(1) ආතතිමානය
(2) බැරෝමීටර
(3) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය
(4) වාෂ්පීකරණ තැටිය
(5) $P^H$ මීටරය (......)

50 ගබඩා කිරීමේ දී වී වල තෙතමන ප්‍රමාණය,

(1) 14% ට වඩා අඩු විය යුතුය.
(2) 16% ට වඩා අඩු විය යුතුය.
(3) 12% ට වඩා අඩු විය යුතුය.
(4) 10% ට වඩා අඩු විය යුතුය.
(5) 18% ට වඩා අඩු විය යුතුය. (......)

(ලකුණු 2 × 50 = 100)

e-thaksalawa The National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# කෘෂි විද්‍යාව - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **A** කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 10 කි.)
- මෙම ප්‍රශ්න පත්‍රය **A** හා **B** යන කොටස් දෙකකින් යුක්ත වේ.

## A කොටස  ව්‍යුහගත රචනා

01 (a) (i) පසෙහි ප්‍රධාන සංඝටක ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(ii) අවම බිම් සැකසීමෙහි වාසි තුනක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

(b) තවාන් පාත්ති ජීවාණුහරණය කිරීමට යොදාගන්නා ක්‍රම තුනක් නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

(c) රසායනික පොහොර භාවිතයෙහි වාසි තුනක් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

02 (a) ගොවියෙකුට සිය අස්වැන්න නෙලා ගත් විගස ඊළඟ කන්නයේ දී සිටුවීම සඳහා විවිධ බෝගවල බීජ ගබඩා කර තැබීමට අවශ්‍ය විය.

(i) ගබඩා කිරීම සඳහා සැකසූ බීජවල අඩංගු විය යුතු තෙතමන ප්‍රමාණයේ ප්‍රශස්ත පරාසය කුමක් ද?

..........................................................................................

(ii) බීජ ගබඩා කිරීමේදී යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

(b) බිම වැතිරී වැඩෙන බහු වාර්ෂික වල් පැලෑටි මර්දනය කිරීම අපහසු වීමට හේතු දෙකක් දක්වන්න.

1. ..........

2. ..........

(c) වර්තමානයේ ගොවීන් අතර ඒකාබද්ධ පළිබෝධ පාලනය ඉතාමත් ජනප්‍රියත්වයට පත්ව ඇත.

(i) ඒකාබද්ධ පළිබෝධ පාලනයේ මූලික සිද්ධාන්ත දෙකක් නම් කරන්න.

1. ..........

2. ..........


(ii) අධික ලෙස කෘමි නාශක පරිහරණයේ විපාක තුනක් නම් කරන්න.

1. ..........

2. ..........

3. ..........

03 (a) ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන භාවිත කරන්න.



(i) ඉහත රූප සටහනේ දැක්වෙන උපකරණය නම් කරන්න.

..........

(ii) පාංශු හා ජල සංරක්ෂණය සඳහා ඉහත රූප සටහනේ දැක්වෙන කුඤ්ඤ පේළිය දිගේ සකස් කිරීමට සුදුසු ව්‍යුහ තුනක් නම් කරන්න.

1. ..........

2. ..........

3. ..........

(b) (i) පාංශු $P^H$ අගය අර්ථ දක්වන්න.

..........

(ii) පාංශු ආම්ලිකතාව අඩු කිරීම සඳහා යොදා ගනු ලබන හුණු අඩංගු ද්‍රව්‍ය වර්ග තුනක් නම් කරන්න.

1. ..........

2. ..........

3. ..........

(c) බෝග මාරුවෙහි ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

04 (a) (i) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වී ගොවිතැනේ දී යල කන්නයේ ඒකක අස්වැන්න, මහ කන්නයේ ඒකක අස්වැන්නට වඩා වැඩි වීමට බලපාන ප්‍රධාන හේතුව දක්වන්න.

..........................................................................................................................

(ii) වී වගාවේ දී බීජ වැපිරීමට සාපේක්ෂව, පැළ සිටුවීමේ වාසි දෙකක් ලියන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

(b) මඩ බිම් වී ගොවිතැනේ දී ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු හතරක් ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

4. ..........................................................................................................................

(c) රසායනික නොවන කෘමි පළිබෝධ පාලන ක්‍රම තුනක් ලියන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

The National e-learning Portal for the General Education

## B කොටස රචනා

- **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

**(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.)**

01 (a) ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේ බෑවුම් ලෙස හායනයට ලක්වූ ඉඩම් සඳහා යොදා ගත හැකි පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම කවරේ ද?

(b) ද්වි වාර්ෂික වල් පැළෑටියක් යනු කුමක් ද? ද්විවාර්ෂික වල් පැළෑටි සාර්ථකව පාලනය කළ හැකි ක්‍රම විස්තර කරන්න.

(c) ආහාර සුරක්ෂිතතාවය යනු කුමක් ද? එය සහතික කර ගැනීමට රටකට අනුගමනය කළ හැකි ක්‍රම පැහැදිලි කරන්න.

02 (a) වායව අතු බැඳීම රූප සටහනක් මගින් දක්වා කොටස් නම් කරන්න.

(b) වායට අතු බැඳීමෙහි වාසි මොනවා ද?

(c) බෝග වගා බිම්වල සුලභව භාවිත විවිධ ජලවහන ක්‍රම ලැයිස්තුගත කර ඒවායේ වාසි හා අවාසි සඳහන් කරන්න.

03 (a) බීජ නොවන රෝපණ ද්‍රව්‍ය ගුණනය කිරීමේ විවිධ ක්‍රම සඳහන් කරන්න.

(b) පාංශු පැතිකඩක මතුපිට සිට පහළට පිහිටා ඇති ප්‍රධාන කලාප කවරේ ද? එක් එක් කලාපයේ ප්‍රධාන ලක්ෂණ සඳහන් කරන්න.

(c) පසේ වයනය හා ව්‍යුහය අතර වෙනස්කම් දක්වන්න. මෙම ගුණාංග දෙක පසෙහි ජලය රඳවා ගැනීමේ ගති ලක්ෂණවලට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

04 (a) ක්ෂේත්‍රයේ වී බෝගය සංස්ථාපනය කරන විවිධ ක්‍රම විස්තර කරන්න.

(b) කෘෂිකාර්මික බෝග කෙරෙහි, දුර්වල ජලවහන තත්ත්වයන්ගේ අහිතකර බලපෑම සඳහන් කරන්න.

(c) ආහාර ලේබල් කිරීමෙහි වැදගත්කම විස්තර කරන්න.

05 (a) බෝග අස්වැන්නට බලපාන ප්‍රධාන කාලගුණික සාධක මොනවා ද? මෙම සාධක බෝග අස්වැන්නට බලපාන්නේ කෙසේ ද?

(b) බෑවුම් සහිත ඉඩම් සඳහා යෝග්‍ය පාංශු සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.

(c) පස සෑදීමේ ක්‍රියාවලියට බලපාන සාධක විස්තර කරන්න.

06 (a) කෘමිනාශක ඉසීමේදී යොදා ගත යුතු පූර්ව ආරක්ෂක උපක්‍රම විස්තර කරන්න.

(b) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇති පාංශු කාණ්ඩය කුමක් ද? මෙම පසෙහි බෝග වගා කිරීම ආශ්‍රිතව පැන නඟින ගැටලු සහ එම ගැටලු නිරාකරණය කර ගැනීමේ මාර්ග විස්තර කරන්න.

(c) අධෝභෞම බීජ ප්‍රරෝහණය හා අපිභෞම බීජ ප්‍රරෝහණය අතර ඇති වෙනස්කම් කවරේ ද?

e-National e-Learning Portal for The General Education